# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1907/23 - 2015 මාර්තු මස 25 වැනි බදාදා - 2015.03.25

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

ශුද්ධි පත්‍රිකාව

### 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*යොමු අංකය* : කඩු/06/2/3/73.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : 4-3/06/2012/එච්ඩබ්/389.

මා විසින් 2015 පෙබරවාරි මස 27 වැනි දින අංක 1903/57 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද ඉඩම් අත්කර ගැනීම පිළිබඳ පනතේ 7 වන වගන්තිය යටතේ දැන්වීමේ ඇති මු. පි. කො. 9406 දරන පිඹුරට ඇතුළත් ඉඩම් සඳහා හිමිකම් දැන්වීමේ සහ වන්දි ඉල්ලා සිටීමේ ලිපි මා වෙත යොමු කළ හැකි අවසාන දිනය ද 2015.04.01 ලෙස සංශෝධනය කරමි.

ඒ අනුව, හිමිකම් හා වන්දි පරීක්ෂණ දිනය වෙනුවට 2015.04.22 වැනි දිනය ලෙස සශෝධනය විය යුතු බව මෙයින් ප්‍රකාශයට පත් කරමි.

ඩබ්ලිව්. එම්. දයාවතී,
ප්‍රාදේශීය ලේකම්,
ප්‍රාදේශීය මහලේකම් කාර්යාල,
කඩුවෙල.

2015 මාර්තු මස 24 වැනි දින,
ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය,
කඩුවෙල,

04-319

---

### ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*යොමු අංකය* : බිය 3/1/1/227.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍යා පහත දැක්වෙන ඉඩම/පරවශතාව ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ/පරවශතාවේ විස්තර* :

ගම්පහ දිස්ත්‍රික්කයේ බියගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අධිකාරි පත්තුව සුළු කොට්ඨාසයේ 279ඒ පට්ටිවිල දකුණ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ පට්ටිවිල ගමෙහි පිහිටි ගම්පහ දිස්ත්‍රික් මැනුම් අධිකාරි විසින් 2006.03.26 දිනැතිව සකස් කර ඇති මු. පි. ගම්. 3520 දරන පිඹුරේ කැබලි අංක 01 දරන ඉඩම් කොටස (ප්‍රමාණය හෙක්ටයාර් 0.2923)

ඉඩමේ නම: පට්ටිවිල නගර සභා ඉඩම; විස්තරය: විවෘත මුඩු බිම; මුල් හිමිකම් කියන අය: කොළඹ නගර සභාව; හිමිකම් කියන අය: රජය; ප්‍රමාණය: හෙක්. 0.2923.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2015 ජූනි මස 10 වැනි දින පූ. හා. 10.00ට බියගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු යි.

තව ද, 2015 මැයි මස 27 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම/පරවශතාව ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත්, මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය.

ඩබ්. එච්. වී. පුෂ්පමාලා,
ප්‍රාදේශීය ලේකම්/බියගම,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
සපුගස්කන්ද-මාකොළ

2015 මාර්තු මස 14 වැනි දින,
බියගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.
සපුගස්තන්ද, මාකොළ

04 - 320

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1A - G 21265 - 22 - (2015/03)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.